# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/27 - 2013 ජූලි මස 18 වැනි බ්‍රහස්පතින්දා 2013.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (xii)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ සහිතව (2012 දෙසැම්බර් මස 05 වැනි දින අංක 1787/27 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එහි 21 වැනි වගන්තිය යටතේ සාදන ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු වන්නා වූ ශ්‍රී ලංකාවේ, යාපනය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලබන්නා වූ නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙම නියමය මගින් සංශෝධනය කරනු ලැබේ :–

1. 1 වැනි උපලේඛනයේ (1) වැනි තීරයේ සහ II වැනි අයිතමයේ එහි අනුරූප සටහන්වල සඳහන් "කලා පීඨය" යන අයිතමයට ඉක්බිතිවම සඳහන් වන එකී උපලේඛනයේ I වැනි තීරයේ සහ II වැනි තීරයේ අනුරූප සටහන්වල සඳහන් වන "කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨය" යන අයිතමය ඉවත් කිරීම මගින්; සහ

2. එම උපලේඛනයේ I වැනි තීරයේ සහ II වැනි තීරයේ අනුරූප සටහන්වල සඳහන් "වෛද්‍ය විද්‍යා පීඨය" යන අයිතමයට ඉක්බිතිවම සඳහන් වන "කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය පීඨය" යන අයිතමයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල අවසානයට පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :–

"5 . වාණිජ්‍ය අධ්‍යයන අංශය"

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍යවරයා.

2013 ක් වූ ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.
08-147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 01689—810 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*